# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

මියල්ලෑව ගොවි සංවිධානය
මියල්ලෑව
නවගත්තේගම
<u>අභියාචක</u>

**අභියාචනා අංකය :**
**RTIC/Appeal/ 580/2022**

එදිරිව

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
නවගත්තේගම
<u>පොදු අධිකාරිය</u>

**ඉදිරිපිටදී** :
1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්
3. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්
4. ඒ.එම් නහියා - අධ්‍යක්ෂ ජනරාල්-පුනරුත්ථාපන (විශ්‍රාමික) - කොමසාරිස්

**පෙනී සිටීම** :
අභියාචක දු:ක අංක 070 5361229 ඔස්සේ සම්බන්ධ වේ.
පොදු අධිකාරිය වෙනුවෙන් පෙනී සිටීමක් නැත.

**ලිඛිත සැළකිරීම** :
අභියාචක - 2022.08.17
පොදු අධිකාරිය - 2022.08.10

**විභාග කළ දිනය** : 2022.09.01, 2022.10.20

**තීරණය කළ දිනය** : 2022.10.20

**<u>කොමිෂන් සභාවේ තීරණය</u>**

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක 2021.11.15 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා ඇත.

> <u>2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත.</u>
> <u>අවශ්‍ය තොරතුරු පැහැදිලි කිරීම.</u>
>
> ඔබතුමාගේ 2021.011.09 දිනැති ලිපිය හා බැදේ.
>
> 02. එහි සදහන් 2021.10.01 දිනැති ලිපිය ඔබතුමාගේ කාර්යාලයට භාර දී තිබේද? නැද්ද? යන්න සම්බන්ධයෙන් තැපැල් කාර්යාලයෙන් විමසීමට කටයුතු කර ඇති අතර එය කෙසේවෙතත්, අදාළ ලිපියේ පිටපතක් මේ සමගම ඉදිරිපත් කරමි. (ඇමුණුම1)

03. ඊට අනුශාංගික වශයෙන් මේ සමග ඉදිරිපත් කරන ඇමුණුම් 02 හි, අප විසින් සලකුණු කර දක්වා ඇති කොටසින් අප ඉල්ලා සිටින තොරතුර කුමක්ද යන්න වඩාත් පැහැදිලි වනු ඇති අතර එම ඉඩම් කොටසට හෝ එයින් කොටසකට අදාල වන පරිදි අවසර පත්‍රයක් නිකුත් කර ඇත්නම් හා එහි පිටපතක් ලබා දිය නොහැකිනම් එම අවසර පත්‍රයට අදාල තොරතුරු අප වෙත ලබා දෙන මෙන් ඉල්ලා සිටිමි.

04. මියැල්ලාව ගොවිසංවිධාන බල ප්‍රදේශයට අයත්, බෝගහ වැව යටතේ වගා කරන ගොවි මහත්ම මහත්මීන්ට දෙකන්නයේ ගොවිතැන් කිරීම අහිමි කිරීමට බලපා ඇති ජල ප්‍රශ්නයට කුමන හෝ විසදුමක් ලබා දෙන ලෙසටත් අතිගරු ජනාධිපතිතුමන් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට මෙම තොරතුරු ඉල්ලා සිටින බවා, වැඩිදුරටත් සඳහන් කරමු.

1. එකී ඉඩම් කොටස සඳහා අවසර පත්‍රයක් නිකුත් කර තිබේද? නැද්ද? යන වග
2. එම ඉඩම් කොටස අන්සතු කර ඇත්නම්,
   (අ) අන්සතු කරනු ලැබුවේ කා නමින්ද යන වග,
   (ආ) අන්සතු කරන ලද දිනය
   (ඇ)අන්සතු කරන ලද බිම් කොටසේ ප්‍රමාණය
   (ඈ) එම බිම් කොටසේ මායිම්

තොරතුරු නිලධාරි විසින් 2021.12.06 දින මෙම තොරතුරු ඉල්ලීමට පහත ප්‍රතිචාරය දක්වා ඇත.

*<u>තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම</u>*

*ඔබ විසින් 2021.11.16 දින ඉදිරිපත් කරන ලද ලියාපදිංචි අංක RTI /2021/11 දරන තොරතුරු ඉල්ලීම පනතේ 5 වන උපවගන්තියේ විධි විධාන අනුව පහත සඳහන් කර ඇති හේතු මත/ ඉල්ලා ඇති තොරතුරු අප අධිකාරියෙහි පාලනය හෝ භාරයෙහි නොමැති වීම හේතුව මත ප්‍රතික්ෂේප කරන ලද බව දන්වමි.*

*1. අදාල බලපත්‍රයෙහි හිමිකරු විසින් එහි තොරතුරු වෙනත් පාර්ශවයකට නිකුත් කිරීමට විරෝධය දැක්වීමේ හේතුව මත*

2021.12.20 වන දින නම් කළ නිලධාරී වෙත අභියාචනය යොමු කර ඇති අතර නම් කළ නිලධාරී විසින් තොරතුරු ඉල්ලීමට 2022.01.03 ප්‍රතිචාර දක්වා ඇත.

*02. එම අයදුම්පත සලකා බලා පහත හේතුන් මත එම අභියාචනය ප්‍රතික්ෂේප කරන බව දන්වා සිටිමි.*

*අදාල බලපත්‍රයෙහි හිමිකරු විසින් එහි තොරතුරු වෙනත් පාර්ශවයකට නිකුත් කිරීමට විරෝධය දැක්වීමේ හේතුව මත*

ඒ අනුව අභියාචක විසින් 2022.03.01 දින කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය ඉදිරිපත් කර ඇත.

පොදු අධිකාරිය විසින් 2022.08.10 වන දින දින කොමිෂන් සභාව වෙත ලිපියක් ඉදිරිපත් කරමින් මෙම වැව් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට අයත් වන අතර එහි මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් මැණුම් සිදුකර රක්ෂිත ප්‍රදේශය සලකුණු කර වෙන්කර ඇත. මෙම රක්ෂිත ප්‍රදේශය තුළ කිසිදු බලපත්‍රයක් නිකුත් කර නොමැත. එමෙන්ම 2021.11.15 දින තොරතුරු ඉල්ලීම අනුව රක්ෂිත සීමාවෙන් එපිට ඩබ්.ආර්.සෝමසිරි කුලතුංග යන අයට බලපත්‍රයක් නිකුත් කර ඇත. නමුත් මෙම බලපත්‍රයේ තොරතුරු ලබා දීම ඔහු විසින් ලිඛිතව ප්‍රතික්ෂේප කර ඇත. අදාළ ලිපිය ඇමුණුම - 06 ලෙස ඉදිරිපත් කරමි. තවද, පී.එම්.අනූෂා ලක්මාලි නමින් බලපත්‍රයක් නිකුත් කර නොමැති බව දක්වා ඇත.

**සළකා බැලීම**

අද දින පොදු අධිකාරිය පරීක්ෂණයට සහභාගි වී නොමැති අතර පරීක්ෂණය සඳහා සහභාගි වීමට දිනයක් ඉල්ලා ඇත. අද දින පරීක්ෂණය සඳහා ලබා දී ඇති දෙවන දිනයයි. මේ අනුව පොදු අධිකාරිය අද දින පරීක්ෂණයට සහභාගි නොවීමට ඉදිරිපත් කර ඇති හේතු ඔවුන් පරීක්ෂණයට සහභාගි වීම නොවැළැක්වීමට තරම් ප්‍රබල හේතු නොවේ.

එසේම අභියාචක විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු ඉල්ලීමට අනුව ලබා දීමට ඇති තොරතුරු ඉතාමත් සරල තොරතුරු වේ. එබැවින් එවැනි තොරතුරු ඉල්ලීමක් මත ඉදිරිපත්ව ඇති මෙම අභියාචනා පරීක්ෂණය තවදුරටත් කල් දැමීම යුක්ති සහගත නොවේ.

තොරතුරු මුදා හැරීම ප්‍රතික්ෂේප කිරීමට පොදු අධිකාරිය පනතේ පැහැදිලි ප්‍රතිපාදනයක් අදාළ කරගෙන නැත. ඔවුන් සඳහන් කර ඇත්තේ අදාළ බලපත්‍රයේ හිමිකරු විසින් එම තොරතුරු වෙනත් පාර්ශවයකට නිකුත් කිරීමට විරෝධය දක්වා ඇති බවය. පොදු අධිකාරියේ මෙම ස්ථාවරය පනතේ 5 (1) වගන්තියේ විධිවිධානයන්ට අදාළ නොවන අතර එබැවින් පොදු අධිකාරිය විසින් ගෙන ඇති ස්ථාවරය කොමිෂන් සභාවට පිළිගත නොහැකිය.

ඒ අනුව ඉහත කරුණු සළකා බලා ඉහත සඳහන් තොරතුරු ඉල්ලීමෙන් ඉල්ලා ඇති සියලුම තොරතුරු 2022.11.24 දිනට ප්‍රථම, මෙම කොමිෂන් සභාවට පිටපත් සහිතව, අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරිය ක්‍රියා කළ යුතු බවට තීරණය කරමු.

එසේ තොරතුරු ලබා දීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියට සහ තොරතුරු නිලධාරිට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය යුතු බවට කොමිෂන් සභාව තීරණය කරයි.

**කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.**

අභියාචනය අවසන් කරන ලදී.